www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ජාත්‍යන්තර කමිටුව සහ ඉදිරිදර්ශනයේ විද්‍යාව: ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදය පිලිබඳ ඓතිහාසික විශ්ලේෂණයක්

**Marxism, the International Committee, and the science of perspective: an historical analysis of the crisis of American imperialism**

**පලමුවන කොටස**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 ජනවාරි 11**

සමාජවාදී සමානතා පක්ෂය ජනවාරි 8-9 දිනවල මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර් නගරයේ දී සිය ජාතික සාමාජිකත්වයේ රැස්වීමක් පැවැත්විය. ආරම්භක වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් විසිනි. මෙම වාර්තාව කොටස් තුනකින් පල කෙරෙනු ඇත. (යට දැක්වෙන්නේ පලමු කොටස ය. දෙවැනි කොටස හෙට දින ද අවසන් කොටස ජනවාරි 13 බ්‍රහස්පතින්දා ද පල කෙරෙනු ඇත.)

සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකත්වයේ මෙම ජාතික රැස්වීම ආරම්භයේ දී පසුගිය මස ඉන්දියානු සාගරය හරහා ගමන් කල සුනාමියෙන් මරනයට පත් වූ දකුනු ආසියාවේ දස දහස් සංඛ්‍යාත ජනී ජනයා ගේ මතකයට ප්‍රනාමය දැක්වීම සඳහා මිනිත්තුවක නිශ්ශබ්දතාවය පැවැත්වීම උචිත වේ.

මුලුමහත් පෘථිවි ගෝලය හරහා, සුනාමියට ගොදුරු වූවන් හා ගැඹුරින්ම එක්ව විඳින ලද තදනුකම්පනයක් ද, සහෘදතා ප්‍රකාශනයක්ද උතුරා ගියේ ය. සැබෑ ශෝකයේ මෙම ප්‍රකාශනයන්, ඇමරිකානු හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ නායකයන් විසින් අකැමැත්තෙන් දැක්වුනු, කුහක, සහ හුදු උපචාරී (මූනිච්චා) සහගත උත්සුකතා ප්‍රදර්ශනයට වඩා කෙතරම් වෙනස් ද. බුෂ් හා බ්ලෙයාර් යන දෙදෙනාම මෙම මහා ව්‍යසනය විසින් ජීවිත විනාශභාග් කෙරුනු දස ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ඉරනම පිලිබඳව කවරෙකුට හෝ ඒත්තු යන පරිද්දෙන් තම උත්සුකබව දැක්වීමට අසමත් වූවෝ ය.

දරන-හරිමින් පැවති ව්‍යසනයට ධවල මන්දිරය ප්‍රතිචාර දැක් වූ - වඩාත් නිවැරදිව කිව හොත් ප්‍රතිචාර නො දැක් වූ - ආකාරය ගැන මාධ්‍ය පවා අපහසුවට පත් වූහ. ප්‍රථමයෙන් ම ඇමරිකානු ජනාධිපතිවරයා තමාගේ ටෙක්සාස් ප්‍රාන්තයේ පිහිටි යෝධ වතුයායේ පැන පැන ඇවිදිමින් ද, බ්‍රිතාන්‍ය අගමැතිවරයා මිසර වෙරලේ සුවදායක අව්වේ සම පැහැ ගන්වා ගනිමින් ද, දවස් තුනකට වැඩි කාලයක් තිස්සේ සුනාමි විපතේ විපාකයන් මුලුමනින් ම නොතකමින් පවත්වා ගෙන ගිය අත්‍යසාමාන්‍ය නිශ්ශබ්දතාවය වියත ඉක්බිති ඩොලර් මිලියන 15ක, පසුව මිලියන 35කට ද, ධවල මන්දිරයේ කුම්මැහිකම ජාත්‍යන්තර අපහාසයට ලක් වූ කල්හි ඩොලර් මිලියන 350කට ද ඉහල දමන ලද බුෂ්ගේ මසුරු පිදවිල්ල දක්නට ලැබිනි. සත්තකටම, ජනයා මරාදැමීම සඳහා - විශේෂයෙන් ම ඉරාකයේ දී - එක්සත් ජනපදය වියදම් කරන මුදල් සම්භාරය හා සමාන කරන කල්හි ඩොලර් මිලියන 350ක් යනු 'පොකට් මනි' වලට වැඩි නැත.

ඩොලර් මිලියන 350ක් යනු වැටුප් හැටියට ද කොටස් ලාභ පංගු ලෙස ද ඇමරිකානු මහ කොම්පැනිවල ප්‍රධාන විධායක නිලධාරීන් අතර ඉහලම 500 දෙනාට වාර්ෂිකව ගෙවනු ලබන මුදල් වලින් කුඩා ප්‍රතිශතයක් පමනි. ඔවුන්ට ගෙවනු ලබන්නේ ඩොලර් බිලියන ගනනිනි. 2003 දී එම්බීඑන්ඒ සමාගමේ චාර්ල්ස් එම් කෝලි ට ගෙවන ලද මුලු දීමනාව ඩොලර් මිලියන 45 ඉක්මවිය; මෙරිල් ලින්ච් හි ස්ටැන්ලි ඕනීල් ට ඩොලර් මිලියන 28.3ක් ගෙවන ලදි. අෆ්ලැක් හි ඩැනියෙල් පී ඇමොස්ගේ දීමනාව ඩොලර් මිලියන 37.3කිත ඇමරිකන් එක්ස්ප්‍රස් සමාගමේ කෙනත් එල් චෙන්නෝල්ට් ට ඩොලර් මිලියන 40ක් ද ඇන්හියුසර් බුෂ්හි පැට්රික් ස්ටෝක්ස්ට ඩොලර් මිලියන 49ක් ද ගෙවන ලදි. මා මේ නම් තරමක් අහඹු ලෙස තෝරා ගත්තේ කෝපරේට් නිලධාරි 1,000ක් පමන දෙනාට ගෙවන මහා සංගත පඩි ගනන් සොයා එලිදරව් කරන වෙබ් අඩවියකිනි.[1]

මේ මිනිසුන්ගේ උතුරායන මුදල් සම්භාරය සලකා බලන කල්හි මාධ්‍යයන්හි වාර්තා වී තිබෙන එක්සත් ජනපදයෙන් ලැබෙන ත්‍යාග ප්‍රතිපදාන කිසි සේත් ම සිත් කාවදින බවක් පෙනීයන්නේ නැත. චෙක්පතක් ලිවීමට පෙර තම ගනකාධිකාරින් සමග කතා කොට

ඉන් තමන්ට ලැබෙන බදු වාසි ගැන කතාබහ කරන සංගත අධ්‍යක්ෂකවරුන්ට වඩා, සාමාන්‍ය කම්කරු පන්තික දායකයා විසින් තමන්ගේ සති පඩියෙන් මහත්සේ වැඩි ප්‍රතිශතයක් සහනාධාරවලට ප්‍රදානය කරනු ලබන බව කෙනෙකුට සහතික විය හැකි ය.

සුනාමියෙන් ඉක්බිත්තේ, විනාශයේ භූ විද්‍යාත්මක හේතු පැහැදිලි කරන ලිපි ගනනාවක් පල වී තිබේ. මෙය වැදගත් විද්‍යාත්මක තොරතුරු සහිත ය. එහෙත් මේ භයංකර ජීවිත හානියේ ප්‍රමුඛ හේතුකාරක අංශය අන්තර්ගත කර ගන්නා අර්ථභාරී සමාජමය සාධකයන් පිලිබඳ විශ්ලේශනයක් මගින් එය අනුපූරනය කල යුතුව ඇත. එහෙත් සොබාධර්මයාගේ භයංකර අරමුනුවල අභිරහස් භාවය ගැන දේශනයක් පැවැත්වීම වඩා පහසු කාර්යයක් සේ බාරගෙන සිටින මාධ්‍ය විසින් එම කර්තව්‍යය පොදුවේ මග හරිනු ලැබ ඇත. ඒ අනුව, *නිව්යෝර්ක් ටයිම්ස්* පුවත්පතේ (විශේෂ) ලේඛක ඩේවිඩ් බෲක්ස් අපට දැනුම් දී ඇත්තේ ''විශ්වයේ ප්‍රධාන උත්සුකය වී පවත්නේ මානවයින් නො වේ. අප පොලවේ පිට ලෙල්ලේ ජීවත්වන මැක්කන් පමනි. මහ පොලව දෙවුර සැලූ කල්හි මැක්කෝ 140,000ක් නසිති. ඔවුහු තමන්ට වඩා අති විශාල වූ ද වඩාත් ස්ථිර වූ ද බලවේගවල ගොදුරු ය.'' නූගත් කමෙන් ද මානව වර්ගයා පිලිබඳ පිලිකුලෙන් ද සමන්විත වන මේ වර්ගයේ විමර්ශන ඉතා නිශ්චිත කාර්යයක් ඉටු කරයි. එනම්: යථාර්ථය මගහැර අප්‍රසන්න සමාජආර්ථික හා දේශපාලන සත්‍යයන් වසන් කිරීම ය.

සුනාමියේ බලපෑම විශේෂයෙන් විචිත්‍ර ආකාරයකට ධනවාදයේ අතාර්කික ස්වභාවයත්, පලල් මහ ජනතාවගේ ජීවන මට්ටම් ඉහල දැමෙන ආකාරයකට නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමට එයට ඇති නොහැකියාවත් විදහා දැක්වීය. මාධ්‍ය ''ආසියානු ආශ්චර්යය'' පිලිබඳ මැත දොඩවති, එහෙත් සත්‍යය නම් ආසියානු ප්‍රදේශය තුලට පසුගිය දශකය තුල ප්‍රාග්ධනය කාවැද්දීමේ වාසිය කුඩා වරප්‍රසාදිත ප්‍රභුවක් අතට පමනක් ම පත් වී ඇති බව ය. ආසියාවේ දසලක්ෂ සංඛ්‍යාත ජනකායක් ජීවත් වන්නේ ඉතා මත් යහපත් කාලගුනික තත්වයන් යටතේ පවා ස්වාභාවධර්මයේ මූලික බලවේගවලින් යම්තම්වත් ආරක්ෂාවක් සපයා නොදෙන මුඩුක්කුවල ය. 150,000කට වැඩි ජනතාවකගේ ජීවිත හානි කල ව්‍යසනයක් ජාත්‍යන්තර ආර්ථික ප්‍රජාව විසින් ප්‍රමුඛ ආර්ථික සිද්ධියක් ලෙස ගනන් ගනු නොලැබීම ම පෙන්නුම් කරන්නේ මෙම ප්‍රදේශයේ ආර්ථික වර්ධනයේ අමානුෂික ස්වභාවය ය. සුනාමියෙන් ඉක්බිත්තේ ඉන්දුනිසියාව ද තායිලන්තය ද, ඉන්දියාව හා ශ්‍රී ලංකාව ද ඇතුලත් මෙම ප්‍රදේශයේ කොටස් වෙලඳපොලවල සැලකිය යුතු පිරිහීමක් සිදු වී නැත. මෙම රටවල ජනකායගෙන් විශාල පංගුවක් කෙතරම් දිලිඳු බවක ජීවත් වෙත්දැයි කිව හොත් ජාතික ආර්ථිකයට ඔවුන් දරන්නේ අනියම් සම්බන්ධතාවක් පමනක් වීම මෙයට හේතුව ය.

මේ රටවල පවත්නා සමාජ කොන්දේසි ඒවායේ දේශපාලන ඉතිහාසයට සම්බන්ධ කල යුතු ය. පසුගිය සතියේ වැඩි ම විනාශයට මුහුන පෑ රටවල්වන ඉන්දුනිසියාව හා ශ්‍රී ලංකාව දෙස බලමු. 1965 ඔක්තෝබර් 1 දින සිද්ධීන්ගෙන් වෙන් කොට ගෙන නූතන ඉන්දුනිසියාව තුල පවත්නා සිත් කම්පා කරවන දිලිඳුකම, පෘථුල මන්දපෝෂනය සහ පිරිමින්ට අවුරුදු 65කට අඩු වූ ජීවිතාපේක්ෂාවක් තිබීම වටහා ගත නොහැකි ය. ඉහත සඳහන් දින ජෙනරාල් සුහර්තෝ විසින් මෙහෙයවුනු ඉන්දුනිසියාවේ ෆැසිස්ට් වර්ගයේ මිලිටරි නිලධාරින් සමග එක්ව වැඩ කල සීඅයිඒ සංවිධානය වාම ජාතිකවාදී සුඛර්නෝව බලයෙන් පහකල කුමන්ත්‍රනයක් සංවිධානය කලේ ය. මෙම කුමන්ත්‍රනයෙන් පසුව හමුදා නිලධාරීන් ද දක්ෂිනාංශික මුස්ලිම් ආගම්වාදී ඝාතක කන්ඩායම් ද එකතුව සීඅයිඒ සංවිධානය විසින් සම්පාදනය කරන ලද ලැයිස්තු යොදා ගනිමින් ඉන්දුනිසියානු කොමියුනිස්ට් පක්ෂයේ ද මෙතෙක් වාමාංශික සංවිධානවල ද පන්ලක්ෂයකට අධික සාමාජික සංඛ්‍යාවක් මරා දැමූ හ. මීලඟ දශක තුන තුල එක්සත් ජනපදය සහය දුන් මුර්ග මර්දනකාරී පාලනයක් පවත්වා ගෙන ගිය ජෙනරාල් සුහර්තෝ ඉන්දුනිසියාව ධනේශ්වර ආයෝජන සඳහා සුරක්ෂිත කර දුන්නේ ය. මේ සමග පැමිනි ව්‍යාකූල හා විනාශකාරී ධනේශ්වර වර්ධනය 1998දී ඉන්දුනිසියානු ආර්ථිකය විනාශ කර දැමූ මූල්‍ය සුනාමියෙන් මස්තකප්‍රාප්ත විය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගතහොත් එරටේ අනාරක්ෂිත වෙරලබඩ ප්‍රදේශය අතුගා දැමූ සුනාමියට බොහෝ කලකට පෙර පිට පිට පාලනය කල ධනේශ්වර ආන්ඩුවල ජාත්‍යෝත්තමවාදී හා ප්‍රතිගාමී පිලිවෙත් මගින් එරට විනාශ කර දමනු ලැබ තිබිනි. තීරනාත්මක සමාජ පිරිවැය වර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ ධනපති පන්තිය විසින් අවුලුවනු ලැබූ සිවිල් යුද්ධයක මූල්‍යමය අවශ්‍යතාවයන්ට යටත් කර තිබුනි.

එහි සැබෑ සමාජ-ආර්ථික හා දේශපාලන සන්දර්භය තුල බහා පරීක්ෂා කරනු ලැබූ කල්හි පැහැදිලි වන්නේ සුනාමියක විනාශකාරී බලය ස්වභාව ධර්මයට වඩා මිනිසාගේ වැඩ කටයුතුවල විපාකයක් බව ය.

සුනාමියක් තරම් මූලධාතුමය වූ ද ප්‍රාථමික වූ ද බලවේගයක් විසින් ජීවිත දහස් ගනන් අහෝසි කර දැමීමක් පිලිබඳව සිතන්නටවත් නොහැකි තත්වයක් කරා ස්වභාව ධර්මය විජයග්‍රහනය කිරීම කරා අනාගතයේ කිසියම් අවස්ථාවකදී විද්‍යාවේ සහ තාක්ෂනයේ වර්ධනය මානව වර්ගයා ලඟා කරනු ඇත. අඩු ගනනේ ජීවිත ගලවාගැනීමේ ආරක්ෂක ප්‍රතිපියවරයන් ගැනීම හැකිවන පරිද්දෙන් මෙවන් සිද්ධියක් පෙර දැකීමට මිනිසාට හැකි වනු ඇත. ඇත්තටම එවන් තාක්ෂනය දැනුදු පවත්නා බවත්, පැසිෆික් කලාපය තුල එය ක්‍රියාත්මක කර ඇති බවත් අපි දනිමු. අදාල කාරනය නම්, මිනිසා විසින් ස්වභාව ධර්මය ජය ගැනීම රඳා පවත්නේ ඔහු විසින් තමාගේ ම සමාජ ආර්ථික පදනම් ජය ගැනීම මත බව යත සමාජයේ ආර්ථික ව්‍යූහය තුලින් අතාර්කික බවේ

සකලාංගයක්ම අහෝසි කර දැමීම - එනම් සමාජවාදය මගින් ධනවාදය අහෝසි කර දැමීම මත බව ය.

දේශපාලන ප්‍රතිගාමීත්වයේ පවත්නා වාතාවරනය තුල, එමගින් මිනිසුන්ගේ හැඟීම් හා බුද්ධිය සිරකර දැමීම තුල, එවන් මහා පරිවර්තනයක ශක්‍යතාවය අභව්‍ය වූ ද දුර වූ ද එකක් සේ පෙනී යයි. එය ම එම පරිවර්තනයේ ඓතිහාසික කොන්දේසි වේගයෙන් මුහුකුරා යන බවට ඇඟැවීමක් ද වේ. සත්තකින්ම අප අලුත් වර්ෂයක් කරා එලඹෙත් ම ලෝක ධනවාදය නව ආර්ථික අර්බුදයක ද දේශපාලන මහා පෙරලියක ද නව කාල පරිච්ඡේදයකට ඇතුලුවෙමින් පවත්නා බවට වැඩෙන ඇඟැවීම් පවතී. මෙම රැස්වීම ඉදිරියේ පවත්නා කර්තව්‍යය වන්නේ ලෝක තත්වය පිලිබඳ හැකිතාක් නිවැරදි තක්සේරුවක් කර ගැනීම ය; එම පදනම මත සමාජවාදය සඳහා සැබෑ ප්‍රතිචාරයකට පදනම තක්සේරු කර මෙම තක්සේරුවෙන් ගලා එන දේශපාලන කර්තව්‍යයන් නීර්නය කර ගැනීම ය. මෙම වැඩ කටයුතු විද්‍යාත්මක ස්වභාවයක් උසුලයි.

ලියොන් ට්‍රොට්ස්කි 1933 අප්‍රේල් මාසයේ දී, සිඩ්නි හුක්ට ලිපියක් යවමින්, එකල්හි තරුන රැඩිකල් මහාචාර්යවරයෙකුව සිටි හුක් විසින් *ද නේෂන්* පුවත් පතට යවන ලද ''මාක්ස්වාදය - ආදානයක් ද විධික්‍රමයක් ද? '' යන ලිපියේ සමහර සූත්‍රවලට අභියෝග කලේ ය. මාක්ස්වාදය ''ආදානයක් ද නො වේ, මිථ්‍යාවෘත්තාන්තයක් ද නො වේ, වෛෂයික විද්‍යාවක් ද නො වේ එය වනාහි පන්ති ක්‍රියාවේ යථාර්ථවාදී විධික්‍රමයක් ය'' යි හුක් ප්‍රකාශ කලේ ය. මෙයට ට්‍රොට්ස්කි මෙසේ පිලිතුරු දුනි. ''මෙහි 'යථාර්ථවාදී' යන වචනය දරන්නේ කුමන අර්ථයක් ද? විශදවම ඉන් ඇඟවෙන්නේ වෛෂයිකය මත, මෙහිදී නම් සමාජ සන්තතීන් පිලිබඳ සැබෑ ඥානයක් මත පදනම්වය යන්න ය. වෛෂයිකය පිලිබඳ ඥානය වනාහි විද්‍යාවකි. මාක්ස්වාදී පිලිවෙත යථාර්ථවාදී වන්නේ එය විද්‍යාවක් වන මාක්ස්වාදය මත පදනම්ව ඇති හෙයිනි.''[2]

දේශපාලන ඉදිරිදර්ශන සූත්‍රගත කිරීම විද්‍යාත්මක වැඩක් ය යන ට්‍රොට්ස්කිගේ සංකල්පනය දේශපාලන සන්තතීන් නියාමධාරී ආකාරයකට විකසිත වන්නේ ය යන ප්‍රස්තුතය ගැබ් කර ගනී. ශක්‍යතාවය සහ අහම්බය ඓතිහාසික සන්තතිය තුල පරමය බවට ඔසොවාලන්නා වූ ද, ඉතිහාසය හා දේශපාලනය අවසාන විග්‍රහයේ දී නිර්නිත වන්නේ අහඹුවල අන්තර් ක්‍රියාකාරිත්වය මගින් හා පෙර දැකිය නොහැකි වූ සහ / හෝ අනාවැකි කිව නොහැකි වූ දේවල අන්තර් ක්‍රියාකාරිත්වය මගින් ය යන ප්‍රති-මාක්ස්වාදයේ සකල තත්කාර්යවාදී ප්‍රභේදයන්ට එවන් ආකල්පයක් අඳුකොල ය. කලෙක ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක්ව සිටි නැසීගිය ෆ්‍රැන්කෝ ෆ්‍යුරේ ඉහත සඳහන් දෘෂ්ටි ආස්ථානය පහත සඳහන් ආකාරයට සංක්ෂිප්ත කලේ ය: ''අපේ සමය පිලිබඳ සැබෑ වැටහීමක් ශක්‍ය වන්නේ අප ආවශ්‍යකත්වයේ මායාවෙන් ගැලවී ගත් කල්හිය; විසිවන ශතවර්ෂය - අර්ථකථනය කල හැකි තාක් දුරට - අර්ථකථනය කල හැකි එකම ක්‍රමය නම්, එහි සිදු වූ ඉතාම ආසන්න බේදවාචකයන්ට වඩාත් වගකිව යුතු වූ අය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති ගති ලක්ෂනයක් වන - එහි පෙර දැකිය නොහැකි ස්වභාවය යලි තහවුරු කිරීම ය.'' [3]

ෆියුරේගේ තර්කය දිග හැරෙන්නේ ඉතා අනම්‍ය රාමුවක් තුල ය; එම රාමුව නම් සහතික බවේ කිසියම් අර්ථහාරී මට්ටමකින් අනාගතය පෙර දැකිය නොහැකිවන හෙයින්, ඓතිහාසික ආවශ්‍යකත්වය පිලිබඳව කතා කිරීම විසුලුවක් බව ය. ෆියුරේට, ආවශ්‍යකත්වය යනුවෙන් ඇඟවෙන්නේ තනි, එකම සිතාගත හැකි නිගමනයක් කරා නොවරදවා ම මග පෙන්වන්නා වූ අනිවාරනීය බලවේගයක් පවත්නේ ය යන්න ය. ඓතිහාසික සංවර්ධනයේ ගමන් මග වෙනස් වූ ද බෙහෙවින් ප්‍රතිවිරුද්ධ වූ ද ප්‍රතිඵලවලට දොර හැරිය හැකි ය යන්න පැහැදිලි කාරනයක් වන හෙයින් ඓතිහාසික සන්තතිය නියාම පාලිත ය යන විශ්වාසය ද එම නියාම වටහා ගෙන ඒ මත ක්‍රියා කල හැකි ය යන්න ද [ඔහුට] මාක්ස්වාදී මායාවක් පමනි. මෙම ඓතිහාසික භෞතිකවාදයට එරෙහි ෆියුරේ හැල්ල දිගහැර තිබුනේ අද ද සදාකාලයට ද ධනවාදයේ ආවශ්‍යකබව තහවුරු කිරීම සඳහා ලියවුනු, පොතක් තරම් දිග විවාද කෘතියක් තුල ය යන්න ගැන කෙනෙක් පුදුම විය යුතු නැත.

ප්‍රතිමාක්ස්වාදීන් අතර බොහෝ සුපුරුදු ෆියුරේ ගේ මෙම ආස්ථානය එලිදරව් කරන්නේ නියාමය හා ආවශ්‍යකත්වය පිලිබඳ සංකල්පය විසින් අරුත්බර කරනු ලබන්නේ කුමක් ද යන්න පිලිබඳ බොලඳ වැරදි වැටහීමකි. මාක්ස්වාදයේ විද්‍යාත්මක ස්වභාවය තීන්දු වන්නේ එහි අනාවැකි නිශ්චිත ලෙස නිවැරදි වීම මගින් නො වේ.

මාක්ස්වාදය වුව වෙනත් විද්‍යාත්මක ශික්ෂනයක් වුව කිසියම් ප්‍රපංචයක් පිලිබඳව කරන විස්තරයක් අත් කර ගැනීමට සමත්වන නිරවද්‍යභාවය කොතරම් දැයි අවසානයේ දී තීන්දු කෙරෙන්නේ එම ප්‍රපංචයේ ම ස්වභාවය විසිනි. ඉතාම දෘඪ-ගවේශී ඓතිහාසික භෞතිකවාදයට පවා දින දෙකකින්, සති දෙකකින්, හෝ මාස දෙකකින්, හරියටම කුමක් සිදුවේ දැයි ''අනාවැකි'' පල කිරීමට හැකි කරන්නා වූ ස්වභාවයක් ඉතිහාසයෙහි විෂය වූ ප්‍රපංචයේ - එනම් මානව සමාජයේ - වෛෂයික ස්වභාවය විසින් දරනු නොලබයි. මෙය වනාහී ඓතිහාසික සන්තතියේ නියාමධාරී ස්වභාවය හෝ එම සන්තතිය පිලිබඳ විද්‍යාත්මක හැදෑරීමක් හෝ ප්‍රතික්ෂේප කරන තර්කයක් නො වේ. ඒ වෙනුවට ඉහත සඳහන් කරුන විසින් ඉල්ලා සිටින්නේ නියාමධාරී ස්වභාවය ඓතිහාසික සන්තතිය තුල ප්‍රකාශිතව පවත්නේ කෙසේ ද යන්න පිලිබඳ වඩාත් ප්‍රගාඪ වැටහීමකි. ලූකාෂ් පැහැදිලි කල පරිදි, ''විද්‍යාත්මක නියාමයන් ප්‍රවනතාවයන් හා ආවශ්‍යකත්වයන් ලෙසින් සැබෑ ලෝකය තුල පරිපූර්නත්වයක් අත් කර ගැනීමට සමත්වන්නේ

ප්‍රතිවිරුද්ධ බලවේගයන්ගේ පැටැලීම තුල ම, අනන්ත අහම්බයන් මගින් සිදු කැරෙන්නා වූ මාධ්‍ය ගත වීමක් මගින් ම පමනි.'' [4]

ඓතිහාසික සන්තතිය ප්‍රතිඵලය පූර්ව නිර්නිත නැත. එහි වර්ධනය විවිධ දිශාවලට ගමන් කල හැකි ය, යන කාරනය වනාහි සමාජ විකාශනය වෙනස් වූද, අන්‍යොන්‍ය වසයෙන් සමහන් කල නොහැකි වූ ද අරමුනු සොයන්නා වූ ප්‍රතිවිරුද්ධ පන්තීන්ගේ අරගලයක් තුලින් සිදුවන්නක් ය යන කාරනයේ විපාකයක් වේ.

එහෙත් සමස්තයක් වසයෙන් පන්ති වේවා, එම පන්තීන් තමන්ගේ සමාජ-ආර්ථික අවශ්‍යතා අඩු හෝ වැඩි වසයෙන් සැහෙන ප්‍රකාශනයක් අත්පත් කර ගැනීමට යොදාගන්නා පක්ෂ හෝ පුද්ගලයන් හෝ වේවා නිදහස් ඒජන්සි ලෙස ක්‍රියාත්මක වන්නේ නො වේ. ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයේ පුලුල් බව සහ ස්වභාවය නීර්නය කරනු ලබන්නේ ධනේශ්වර නිෂ්පාදන මාධ්‍යයේ නියාමයන් මගිනි.

මෙය සත්‍යවන්නේ කම්කරු පන්තිය පිලිබඳව පමනක් නො වේ; ධනේශ්වර පාලක ප්‍රභුව පිලිබඳව ද මෙය සත්‍යයක් වේ. අපගේ පක්ෂයේ දේශපාලන ඉදිරිදර්ශනය ඇරඹෙන්නේ ආත්මීය වසයෙන් ප්‍රේරිත අපේක්ෂා හෝ ආශාවන් ගෙන් නො වේ. මාක්ස්වාදීන් විප්ලවය සංකල්පනය කර ගන්නේ ධනපතියන්ගේ නපුරු-ක්‍රියාවලට දඬුවමක් ලෙස හෝ දිලිඳුකම අහෝසි කිරීමට තමන් දරන්නා වූ පරහිතකාමී ප්‍රයත්නයට තෑග්ගක් හැටියට හෝ නො වේ. විප්ලවවාදී පක්ෂයේ ඉදිරිදර්ශනය වර්ධනය විය යුත්තේ ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ වෛෂයික වසයෙන් තථ්‍ය වූ ප්‍රතිසතිතාවන් පිලිබඳ විශ්ලේශනයකිනි. එවන් විශ්ලේෂනයක් විප්ලවවාදී ඉදිරි දර්ශනයේ ඉතාම පොදු පදනම සපයා දෙයි.

එවන් ඉදිරි දර්ශනයක සවිස්තර පැහැදිලි කිරීමක් මෙම ප්‍රතිසතිතාවල සංවර්ධනය තථ්‍ය-ජීවමාන සමාජ-දේශපාලන ප්‍රකාශනයක් අත් කර ගැනීම සඳහා ගමන් කල යුතුව ඇති බහුවිධ සමාජ, සංස්කෘතික හා බුද්ධිමය ස්ථරයන් තුලින් මාධ්‍යගතවන ආකාරය ග්‍රහනය කර ගත යුතු ය.

මාක්ස්වාදී ඉදිරිදර්ශනයක් දශක ගනනාවක් හරහා දිවෙන පුලුල් ඓතිහාසික සන්තති පිලිබඳව යොමු විය හැකි යත නැත හොත් විප්ලවවාදී ක්‍රියාවේ කාලපරාසය ඊට වඩා කෙටි වූ ක්ෂනික සංයුක්ත දේශපාලන තත්වයන් රාශියක් පිලිබඳව විය හැකි ය. එහෙත් දෙවනු කී අවස්ථාවේ දී වුව මාක්ස්වාදී පක්ෂයේ ආශ්‍රය ලක්ෂ්‍යය වනාහී සෑම විටම පෘථුල ඓතිහාසික ක්‍රියාවලිය යි. සංසන්දිත ගැටලු හා තත්වයන්ගෙන් පැන නැගින සුවිශේෂ අවස්ථාවලට මුහුන දීම සඳහා සකසනු ලබන උපායයන් ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ ඓතිහාසික ක්‍රියාමාර්ගය සහ කර්තව්‍යයන් විසින් නිර්වචනය වූ මූලධාර්මික අරමුනුවලට අනුකූල විය යුතු ය.

ඓතිහාසික යුගයක ස්වභාවය විසින් නිර්වචනය වූ මූලෝපායික අරමුනුවල රාමුව ඇතුලත ඒවා අධ්‍යයනය කරනු නොලැබුවේ නම් සංසන්ධිමය ගැටලු සහ තත්වයන් වටහා ගත නොහැකි බව ද මෙහි ලා කිව යුතු ව ඇත.

අවසාන වසයෙන්, විප්ලවවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීම සඳහා සමාජය හා පන්ති අරගලය කෙරේ සාංකල්පික ආකල්පයකට වඩා ක්‍රියාත්මක ආකල්පයක් අවශ්‍ය බව කිව යුතු ය. වෛෂයිකභාවය යනුවෙන් අකර්මන්‍යතාවය අදහස් නො කෙරේ. වෛෂයික යථාර්ථය හා පන්ති බල තුලනය පිලිබඳ විප්ලවවාදී පක්ෂයේ තක්සේරුව විප්ලවවාදී සන්තතිය මත තමන්ගේ ම මැදිහත්වීමේ බලපෑම හා විපාක පිලිබඳ කිරා මැන බැලීමක් අන්තර්ගත කර ගනී. ෆොයාර්බාක් පිලිබඳ තම එකොලොස්වන ප්‍රවාදයේ දී මාක්ස් පැහැදිලි කල පරිදි ලෝකය පිලිබඳ නිරවද්‍ය අර්ථකථනයක් වර්ධනය කර ගත හැක්කේ ලෝකය වෙනස් කිරීමට කරන අරගලය තුල ය.

එහෙත් ඥානයේ සන්තතිය තුල ''ක්‍රියාත්මක'' අංශය - මෙය සොයා ගැනීම හා විස්තාරනය කර ගැනීමට 18 වන සියවස අග දී සහ 19 වන සියවස මුල දී (අන් සියල්ලටමත් වඩා හෙගල්ගේ වැඩකටයුතු තුල) සිදු කර ගැනීම ජර්මන් සම්භාව්‍ය විඥානවාදී දර්ශනවාදයේ ශ්‍රේෂ්ඨතම විජයග්‍රහනයන්ගෙන් එකක් විය. - පිලිබඳ නිවැරදි තක්සේරුවක් වෛෂයික ලෝකය කාට හෝ උවමනා ඕනෑම ආකාරයකට වෙනස් කල හැකි ය, අලුතින් හැඩ ගැසිය හැකිය යන අදහස ඇතුලත් කර නො ගත යුතු ය.

''අධ්‍යාසයේ'' (අසකක) මිනිසාගේ සමාජ භාවිතාවේ සාරභූත නිර්නායකයන් වූ වෛෂයික, නියාම පාලිත සමාජ සන්තතීන් විද්‍යාත්මකව ඥානනය කිරීමෙන් ක්‍රියාකාරිත්වය වෙන් කර ලන්නා වූ ප්‍රවනතාවයට වඩා භයානක වූ ගම්‍යතාවන් දරා සිටින දාර්ශනික ප්‍රවනතාවයක් තවත් ඇත්තේ නැත. විප්ලවවාදී පක්ෂයේ ක්‍රියාකාරිත්වය පෙරට යා යුත්තේ ලෝක පරිමාන සමාජ ආර්ථික වර්ධනයේ මූලික ප්‍රවනතාවන් පිලිබඳ නිවැරදි තක්සේරුවකිනි. මෙම අත්තිවාරම මත පදනම් කරනු නොලැබී නම්, විප්ලවවාදී ව්‍යාපාරයේ වැඩ කටයුතු පදනම් වනු ඇත්තේ ආවේග හා අනුමානවලට නො වැඩි දේ මත ය... එය විනාශයෙන් සමාප්ත වනු ඇත.

(ඉදිරියට)

**සටහන් :**

1. http://www.aflcio.com/corporateamerica/paywatch/ceou/database.cfm
2. *Writings of Leon Trotsky 1932-33* (New York, 1972), pp. 232-33. [ලියොන් ට්‍රොට්ස්කිගේ ලේඛන 1932-33 (නිව්යෝර්ක්, 1972), පිටු. 232-33.
3. *The Passing of an Illusion* (Chicago, 1999), p.2. [ෆ පාසිං ඔෆ් ඇන් ඉලූෂන් (චිකාගෝ, 1999) පි. 2.
4. *The Ontology of Social Being*, volume 2 (London, 1978), p. 103. [ද ඔන්ටොලොජි ඔෆ් සෝෂල් බීං (ලන්ඩන්, 1978) පි. 103.

© www.wsws.org